# ජාතික ඖෂධ නියාමන අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

## ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුරු සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය දරන තනතුරු වේ. ජාතික ඖෂධ නියාමන අධිකාරිය කොළඹ පමණක් පිහිටා ඇති අතර, වෙනත් ශාඛා, කාර්යාල නොමැති බැවින් ස්ථාන මාරු වීම් රහිත වේ.

## 01. නීති නිලධාරී තනතුර : (පුරප්පාඩු ගණන 01 යි)

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිවේදී ප්‍රථම උපාධියක් සහිතව ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වීම.

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු ලෙස වසර 01 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

(ඇ) ඉංග්‍රීසි භාෂාවෙන් මනා ලෙස වැඩ කිරීමේ හැකියාවක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**වයස :** අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**තනතුරට අදාළ වැටුප් පියවර :** කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 පරිදි MM 1-1 2016 රු. (53,175 -10 X 1,375 – 15 ×1,910 - 95,575/-) වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවර වන රු.53,175/- හා අනුමත දීමනා

**බඳවා ගැනීමේ ක්‍රමය :** විවෘත තරග විභාගයක් හා/හෝ පත්වීම් බලධරයා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙනි.

## 02. අභ්‍යන්තර විගණක තනතුර : (පුරප්පාඩු ගණන 01 යි)

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණය, ගණකාධිකරණය හෝ වාණිජ්‍ය ක්ෂේත්‍රයෙහි උපාධියක්.

**හෝ**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

**සහ**

ඉහත සුදුසුකම ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, රාජ්‍ය මණ්ඩලයක, හෝ පිළිගත හැකි ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එක (01)ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**වයස :** අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**තනතුරට අදාළ වැටුප් පියවර :** කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 පරිදි MM 1-1 රු (53,175 - 10X1,375 – 15X1,910 - 95,575/-) වැටුප් පරිමාණයේ 2020.01.01 දිනට හිමි වැටුප් පියවර වන රු.53,175/- හා අනුමත දීමනා.

**බඳවා ගැනීමේ ක්‍රමය :** විවෘත තරග විභාගයක් හා/හෝ පත්වීම් බලධරයා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

## 03. ඖෂධ විශ්ලේෂක (කොන්ත්‍රාත්) : (පුරප්පාඩු ගණන 12 යි)

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

(අ) රසායන විද්‍යාව/අනුක ජීව විද්‍යාව/ ජීව විද්‍යාව/ ඖෂධවේදය යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂ උපාධියක් ලබා තිබීම.

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු පරීක්ෂණාගාරයක් තුළ විශ්ලේෂණ කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර එක (01)ක පළපුරුද්දක් ලබා තිබීම.

මාසික කොන්ත්‍රාත් වැටුප : රු. 60,975/-

**වයස :** අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය :** විවෘත තරග විභාගයක් හා/හෝ පත්වීම් බලධරයා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙනි.

**වෙනත් කරුණු :-**

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතුය.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2023.07.08 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ cv@nmra.gov.lk යන විද්‍යුත් ලිපිනයට ඊ-මේල් කිරීම මගින් හෝ ප්‍රධාන විධායක නිලධාරී, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, අංක 47, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ යොමු කළ යුතුය. ඊ මේල් මගින් යොමු කිරීමේදී විෂය ලෙසද, තැපැල් කිරීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ද අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති,**
**ජාතික ඖෂධ නියාමන අධිකාරිය.**

# ජාතික ඖෂධ නියාමන අධිකාරිය

## .................................................. තනතුර සඳහා අයදුම්පත

1. පෞද්ගලික තොරතුරු : ..........................................

1.1. සම්පූර්ණ නම : ..........................................

1.2. මුලකුරු සමග නම : ..........................................

1.3. ස්ත්‍රී/ පුරුෂ භාවය : ..........................................

1.4. උපන් දිනය : ..........................................

1.5. වයස : අවු. ................ මාස : ................ දින : ................

1.6. ජාතික හැඳුනුම්පත් අංකය :

1.7. දුරකථන අංකය : ස්ථාවර ........................ ජංගම : ........................

1.8. විද්‍යුත් තැපැල් ලිපිනය : ..........................................

1.9. ලිපිනය : ..........................................

1.10. පදිංචි දිස්ත්‍රික්කය : ..........................................

2. විභාගයට පෙනී සිටින මාධ්‍යය : ..........................................

3. අධ්‍යාපන සුදුසුකම් : (ඉහළම සුදුසුකමේ සිට අනුපිළිවෙලට සඳහන් කරන්න)

| අනු අංකය | සුදුසුකම | විශ්වවිද්‍යාලය / ආයතනය | සම්පූර්ණ කරන ලද දිනය / වලංගු දිනය | විෂයයන් / සාමාර්ථය |
|---|---|---|---|---|
| 01 | | | | |
| 02 | | | | |

04. වෘත්තීය සුදුසුකම්

| අනු අංකය | සුදුසුකම | විශ්වවිද්‍යාලය / ආයතනය | සම්පූර්ණ කරන ලද දිනය / වලංගු දිනය | විෂයයන් / සාමාර්ථය |
|---|---|---|---|---|
| 01 | | | | |
| 02 | | | | |

5. පළපුරුද්ද (දැනට දරන තනතුරේ සිට අනුපිළිවෙලට සඳහන් කරන්න)

| අනු අංකය | තනතුර | ආයතනය | කාලසීමාව |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |

6. අයදුම්කරු පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම්, දුරකථන අංක හා ලිපිනයන්:

7. අයදුම්කරුගේ සහතිකය:

මෙහි ඉහතින් දක්වා ඇති මා පිළිබඳ තොරතුරු මාගේ දැනීම, විශ්වාසය අනුව නිවැරදි හා සත්‍ය බව ප්‍රකාශ කරමි

දිනය :

..........................................
(අයදුම්කරුගේ අත්සන)

8. රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් තම ආයතන ප්‍රධානියාගේ සහතිකය.
මෙම ඉල්ලුම්කරු වන .............................. මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම ආයතනයේ ........................ වශයෙන් ස්ථිර/ තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක ලෙස සේවය කරන බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි බවත් දන්වමි.

..........................................
ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

**සැලකිය යුතුයි :-**

**<u>අදාළ ආකෘතියට අනුව පමණක් අයදුම්පත්‍රය සම්පූර්ණ කර එවිය යුතු අතර,</u>** ඔබගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතිකපත්‍රවල පිටපත් අයදුම්පත්‍රය සමග යොමු කළ යුතු වේ. මෙම ආකෘතියට අනුව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හෝ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.